**ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලෙස රු.580,342,440 ක් ලැබී තිබුණ ද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.163,440 ක් අඩුවෙන් රු.580,179,000 ක් ලෙස දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | විදේශ ප්‍රදාන යටතේ එනම් අරමුදල් මූලාශ්‍රය අංක 13 යටතේ ලැබී ඇති රු.163,440.00 ක මුදල් අග්‍රිම ලැබීම් යටතට එකතු කර නැති අතර එම සම්පූර්ණ මුදලම වියදම් කර ඇත. |
| (ආ) | භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් රු.5,976,146 ක් වී තිබුණත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.173,239 ක් අඩුවෙන් රු.5,802,907 ක් ලෙස දක්වා තිබුණි. එසේම අත්තිකාරම් ගෙවීම් රු.7,754,132 ක් වී තිබුණත් එය රු.173,239 ක් අඩුවෙන් රු.7,580,893 ක් ලෙස දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | අත්තිකාරම් බී ගිණුම සැසඳුම් ප්‍රකාශයේ අංක 2 යටතේ පෙන්වා ඇති මුළු ගෙවීම් රු.7,754,132.00 ක් වන අතර ඊට අංක 3 යටතේ මු.රෙ. 503 (1) අනුව ගැලපුම් රු.173,240.00 ඉවත් කළ පසු නිවැරදි ගෙවීම් රු.7,580,892 කි. තවද ලැබීම් ලෙස ගිණුමේ දක්වා ඇති රු.5,976,146.00 න් මෙසේ වැරදි නිවැරදි කිරීම සඳහා කරන ලද රු.173,240.00 ක් ගැලපීමෙන් පසු නිවැරදි ලැබීම් රු.5,802,906.00 ක් වේ. එය ගිණුම් ක්‍රමය අනුව නිවැරදි කිරීමේදී හිලවු වී යන දෝෂයකි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී 332-1-1-2-2506-13 වැය විෂය යටතේ රු.163,440 ක් වැය කර තිබුණත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් මූලධන වියදම් යටතේ දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් මුළු මූලධන වියදම රු.163,440 ක් අඩුවෙන සේ රු.435,600,801 ක් ලෙස දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | විදේශ ප්‍රදාන යටතේ ලැබී ඇති මෙම මුදල මූලධන වියදමට එකතු කර නැත. |
| (ඈ) | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව ශේෂයත්, දෙපාර්තමේන්තු පොත් අනුව වූ ශේෂයත් අතර පිළිවෙලින් රු.263,795 ක් හා රු.161,990 ක වෙනසක් වුවද එම වෙනස අක්මුදල් ගැලපුම් ගිණුමේ සටහන් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය 7.6 ඡේදය ප්‍රකාරව නිවැරදි අක්මුදල් ගිණුමක් සකස් කොට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වීම. | අත්තිකාරම් ලැබීම් ගෙවීම් ඇතුලත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනය අනුව ශේෂයන් මා විසින් ඉදිරිපත් කරන ලද අත්තිකාරම් බී ගිණුම් සැසඳුම් ප්‍රකාශයන් අතර, කිසිදු වෙනසක් නොමැත. අවසාන ශේෂයද සමාන වී ඇති අතර සිදුවී ඇත්තේ වෙනත් රජයේ ආයතනයක් විසින් සිදුකරන ලද වැරදි හර හා බැර වන රු.173,240 ක හිලව් දෝෂයක් නිවැරදි කිරීම පමණි. |
| (ඉ) | 253-1-2-4-1502-11 වැය විෂය යටතේ දෙපාර්තමේන්තුව විසින් රු.187,386 ක් වැය කර තිබුණ ද, එය රු.67,202 ක් අඩුවෙන් රු.120,184 ක් ලෙස අක්මුදල් ගැලැපුම් ගිණුමේ සටහන් කර තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය 7.6 ඡේදය ප්‍රකාරව නිවැරදි අක්මුදල් ගිණුමක් සකස් කොට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වීම. | එකඟ වෙමි. |
| (ඊ) | 332-1-1-0-1003-11 වැය විෂය යටතේ දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව වියදම රු.29,410,342 ක් වී තිබුණි. එසේ වුවද භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශය අනුව එය රු.29,455,362 ක් වී තිබීම හේතුවෙන් රු.45,020 ක වෙනසක් අනාවරණය විය. කෙසේ වෙතත් එම වෙනස අක් මුදල් ගැලැපුම් ගිණුමේ ගලපා නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය 7.6 ඡේදය ප්‍රකාරව නිවැරදි අක්මුදල් ගිණුමක් සකස් කොට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වීම. | 332-1-1-0-1003-II වැය විෂය යටතේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය පිරික්සුමේ සඳහන් ශේෂය වන රු.29,410,342 නිවැරදිය. නමුත් භාණ්ඩාගාර මුද්‍රිතයේ ශේෂ පිරික්සුමේ රු.29,455,362 ක් ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ලබාදී ඇති දුම්රිය බලපත්‍ර ගාස්තුව වන රු.45,020 ක් ද ඇතුලත්වය. |

## 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා ඒසීඒ 6 ආකෘති පත්‍රය අනුව රු.37,967,000 ක් වටිනා ප්‍රවාහන හා උපකරණ දෙපාර්තමේන්තුව සතුව පවතින බව දක්වා තිබුණි. කෙසේ වෙතත් ඒ තුළ රු.37,050,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 17 ක් ඇතුළත් බව දෙපාර්තමේන්තු පොත් හා ස්ථාවර වත්කම් ලේඛනය පිළිබඳ පරීක්ෂාවේදී විගණනයට අනාවරණය විය. තවද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කොට ඇති 2016 වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු.36,800,000 ක් වටිනා මෝටර් වාහන තොගයක් ස්ථාවර වත්කම් ලේඛනයට හෝ ගිණුම් තුළට ඇතුළත් කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුළත් ස්ථාවර වත්කම් වටිනාකම රු.250,000 ක් වැඩියෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය වූ අතර ඉහත ඌනතා හේතුවෙන් දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් වටිනාකමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැති වත්කම් වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම. | 2016 වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු.36,800,000 ක වටිනා මෝටර් රථය සඳහා ලියාපදිංචි හිමිකරු දෙපාර්තමේන්තුව නොවන බැවින් සිගාස් පද්ධතිය මඟින් එම වත්කම් වටිනාකම් යාවත්කාලීන නොකිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වාචිකව උපදෙස් ලබා දෙන ලදී. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය රු.741,520,868 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. කෙසේ වෙතත් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් රු.10,495,190 හා අග්‍රිම ලැබීම් රු.580,342,442 ක් වශයෙන් එය රු.590,837,630 ක් විය. ඒ අනුව, | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් වශයෙන් දක්වා ඇති රු.161,341,868 කි. වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම වන රු. 10,495,190 ද ඇතුළත් ව ඇති අතර මෙම මුදල මාසික ගිණුම් සාරාංශ අනුවද නිවැරදිම වේ. ඔබ විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.150,683,238 ක් වැඩියෙන් දක්වා ඇත යනුවෙන් සඳහන් කර ඇතත් එය පහත පරිදි වේ. |

| | | | |
|---|---|---|---|
| | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.150,683,238 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | ආදායම් නොවන ලැබීම් රු.150,846,678<br>වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කළ ආදායම රු.10,495,190<br>අග්‍රිම ලැබීම් රු.580,342,440<br>---------------<br>රු.741,684,308<br>==========<br><br>ඒ අනුව දැනට ගිණුමේ දක්වා ඇති මෙහෙයුම් ක්‍රියාකාරමකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.741,520,868 කි. මෙහිදී වෙනස වනුයේ රු.163,440 වන විදේශ ප්‍රදාන යටතේ ලැබුනු අක් මුදලයි. |
| (ආ) | දෙපාර්තමේන්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා වෙනත් මෙහෙයුම් වියදම් සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම ලෙස පිළිවෙලින් රු.152,681,456 ක් සහ රු.45,020 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පුද්ගල පඩිනඩි හා වෙනත් මෙහෙයුම් වියදම් වෙනුවෙන් රු.588,306,843 ක් හා වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් රු.47,467,043ක් දරා තිබීම හේතුවෙන් පිළිවෙලින් රු.435,625,387ක සහ රු.47,422,023ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | දෙපාර්තමේන්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා වෙනත් මෙහෙයුම් වියදම් ලෙස රු.152,681,456 ක් දක්වා ඇති මුදල නිවැරදි වේ. මෙය ඒ.සී.ඒ.2 (ii) ආකෘතියේ සටහන 5 හා 6 හි එකතුව වන අතර, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ද ඒ.සී.ඒ. (ii) ආකෘතියේද මෙම අගයන් නිවැරදිව පෙන්වා ඇත. |
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ, අත්තිකාරම් ආපසු අයකර ගැනීම් ලෙස රු.5,802,907 ක් දක්වා තිබුණ ද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු.5,712,351 ක් වූයෙන් රු.90,556 ක් වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | අත්තිකාරම් අයකර ගැනීම රු.5,802,907 ක් වන අතර එය ඒ.සී.ඒ.2-5 ආකෘතිය අනුවද, තවද අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය 2019 ගිණුම අනුවද මෙය නිවැරදි වේ. |
| (ඈ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් අත්පත් කර ගැනීම සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබූ බව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් ලී බඩු සඳහා රු.103,365 ක් ද, සන්නිවේදන උපකරණ සඳහා රු.30,200 ක් ද, කාර්යාල උපකරණ සඳහා රු.5,290 ක් වශයෙන් භෞතික වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.138,855 ක මුදලක් වැය කර තිබුණි. | - එම - | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා දරන ලද මුදල් ප්‍රවාහ යටතේ, අත්තිකාරම් ගෙවීම් ලෙස රු.7,580,893 ක් දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු.7,592,142 ක් වූයෙන් රු.11,249 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | අත්තිකාරම් ගෙවීම් රු.75,80,893 නිවැරදි වේ. එය ඒ.සී.ඒ.5 ආකෘතිය අනුවද තවද අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය 2019 ගිණුම අනුවද මෙය නිවැරදි වේ. |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මුදල්වල ශුද්ධ වෙනස් වීම ශේෂය ශුන්‍ය විය යුතු වුවද, ඉහත ගැලපීම්වල වෙනස හේතුවෙන් රු.538,835,065ක් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල්වල ශුද්ධ වෙනස් වීම ලෙස දක්වා තිබුණි. | - එම - | පිළිතුරු ලබා දී නොමැත. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛනය පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ඇප ලේඛනය** | | |
| | ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 07/2019 හා 2019.03.23 දිනැති චක්‍රලේඛය අනුව ඉදිරි කටයුතු කරමි. |
| (ආ) | **හානි හා පාඩු ලේඛනය** | | |
| | දෙපාර්තමේන්තුව විසින් හානි පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගිය ද එය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | හානි පාඩු ලේඛනයක් සකස් කර ඇතත් ආසන්නතම කාල සීමාවන් තුල දී සිදු වූ හානි පිළිබඳව සටහන් තැබීමට අතපසු වී ඇත. එයට හේතු වූයේ අදාළ පරීක්ෂණ කටයුතු නිම නොවූ බැවිනි. මින් ඉදිරියට මු.රෙ. 110 අනුව හානි පාඩු සිදු වූ විගස සටහන් කිරීමට කටයුතු කරමි. |

(ඇ) වාහන ලොග් පොත්

| | | |
|---|---|---|
| වාහන ලොග් පොත් නියැදි පරීක්ෂණයේදී වාහන පහ (05) කට අදාළව ලොග් පොත්වල, වාහන පිළිබඳ මූලික විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර හා ගමන් පිළිබඳ මාසික සාරාංශ යනාදී විස්තර ඇතුලත් කර නොතිබූ අවස්ථා දක්නට ලැබුණි. | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | වාහන ලොග් පොත්වල මූලික විස්තර අනුව දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර හා ගමන් විස්තර ඇතුළත් කර නොතිබූ බැවින්, එම අඩුපාඩු මඟ හරවා ගැනීමට දැනටමත් පියවර ගෙන තිබේ. |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පරිදි නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 571 (3) | වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු රාජ්‍ය අදායමට බැර කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වලට අදාළව ඉඩම් ඉල්ලීම සඳහා හා ව්‍යාපෘති අරමුදල් තැන්පතු හැර එකතුව රු.20,995,493 ක් වූ අනෙකුත් තැන්පතු 37 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් මුළුල්ලේ පියවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති ව්‍යාපෘති වල රැඳවුම් මුදල් දිස්ත්‍රික් කාර්යාල නිර්දේශ ලබාගෙන ඉදිරි මාස 02 ඇතුලත නිදහස් කිරීමට කටයුතු කරන අතර ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති වල ඉතිරි මුදල් ව්‍යාපෘති නිම වීමෙන් පසු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි 104 | (i)දෙපාර්තමේන්තුවේ පාදුක්ක හා නුවරඑළිය වැඩ භාර නිලධාරී කාර්යාලයන්හි සිදු වූ රු.203,600 ක් වටිනා පරිගණක උපාංග නැතිවීම සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කොට තිබුණද ඒ තුල අලාභය සඳහා වගකිව යුතු පුද්ගලයින් හදුනාගෙන නොතිබීම හේතුවෙන් නැවත විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කොට තිබුණි. කෙසේ වෙතත් 2020 මැයි 31 දින වන විටත් එකී පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | පාඩු සහ අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පාදුක්ක හා නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලවල සිදු වී ඇති පරිගණක හා උපාංග නැතිවීම සම්බන්ධව සිදු කළ පර්යේෂණ වාර්තා අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත නොකළ හෙයින් ඊට අදාළ පරීක්ෂණ කටයුතු නැවතත් ආරම්භ කර ඇත. |
| | | (ii)අනුරාධපුර වැඩභාර නිලධාරී කාර්යාලයේ 2018 නොවැම්බර් 10 දින සිදු වූ රිය අනතුර සම්බන්ධයෙන් අලාභ හානි නිශ්චය කොට අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම 2020 මැයි 31 දින වන විටත් නිම කර නොතිබුණි. | | මෙ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර විමර්ශන වාර්තාව ලැබී තිබුණද අලාභ හානි පිළිබඳ වාර්තාව මෙතෙක් ලැබී නොමැත. |
| | | (iii)මුදල් රෙගුලාසි 104 (ආ) ප්‍රකාරව අලාභ හානි හැකි ඉක්මනින් අය කර ගත යුතු වුවත් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ධාවනය සඳහා යොදවාගෙන තිබූ වාහන දෙකක් සම්බන්ධයෙන් පිළිවෙලින් 2018 නොවැම්බර් 10 හා 2019 අගෝස්තු 18 දින සිදුව තිබූ අනතුරු සම්බන්ධව අලාභ හානි අයකර ගැනීම හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ගතයුතු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම 2020 පෙබරවාරි 07 දක්වා නිමව නොතිබූ බව නිරීක්ෂණය විය. | -එම- | අංක GA – 1691 දරන වාහනය ඉහත සඳහන් කල අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් වාහනය වේ.<br>අංක CAR – 5337 දරන වාහනයට අදාළ වාර්තාව දැනට ලැබී ඇති බැවින්, ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි. |
| | | | -එම- | |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>------------- | | | |
| | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.2 ඡේදය | 2020 මාර්තු 31 දිනට පෙර පසුගිය වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කළ යුතු වුවත්, දිස්ත්‍රික්ක 05 ක කාර්යාලයන්ට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2020 ජුනි 10 වන දින වන විටත් ආරම්භ කොට නොතිබූ බව අනාවරණය විය. | 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | රට තුල පවතින කෙරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු 13 දිනෙන් පසු රාජකාරි කටයුතු සඳහා කාර්යාල වලට නොපැමිණීම හේතුවෙන් 2020 මාර්තු 31 දිනට පෙර දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 5 ක පමණක් ප්‍රමාද වී තිබුනු අතර, මේ වනවිට එම දිස්ත්‍රික්ක පහේද සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ<br>---------------- | | | |
| | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය | ආයතනය සතු සියලු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දිය යුතු වුවද, 2020 මැයි 31 දින වන විටත් එසේ සිදු කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මාගේ අංක dncws/ac/01057 හා 2020 මැයි 26 දිනැති ලිපිය මගින් මෙම වාර්තාව කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------- | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 ඡේදය | දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබූ බව එම වාහන වලට අදාළ ලොග් පොත් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ වාහනවල ඉන්ධන ධාවනය පරීක්ෂා කිරීම මෙතෙක් සිදු කර නොමැති බැවින්, මණ්ඩලයක් පත් කොට ඉන්ධන දහනය තීරණය කිරීමට වහාම කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ මූලධන වියදම් සඳහා ලද ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,706 ක්වූ අතර ශුද්ධ වියදම රු.මිලියන 435.76 ක් වූයෙන් ඉතිරිය රු. මිලියන 1,270.23 ක් වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 74 ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම සිදු කළ යුතු වීම. | මූලධන වියදම් ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව වූයේ භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා නොදීම නිසා බැවිනි. නමුත් වෙන් වූ මුළු ප්‍රතිපාදන සඳහාම ව්‍යාපාති සඳහා ගිවිසුම් වලට එළඹී වැඩ නිමකර තිබුණි. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පුනරාවර්තන හා මූලධන වැය විෂයය සංකේත අටකට (08) අදාළ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 26 සිට සියයට 94 දක්වා පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම සිදු කළ යුතු වීම. | මූලධන වියදම් ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව වූයේ භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා නොදීම නිසා බැවිනි. නමුත් වෙන් වූ මුළු ප්‍රතිපාදන සඳහාම ව්‍යාපාති සඳහා ගිවිසුම් වලට එළඹී වැඩ නිමකර තිබුණි. |
| (ආ) | වැය විෂය අංක 322-1-1-0-2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම යටතේ වූ රු.1,600,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | - එම - | 2019 වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන වෙන්කර තිබුනද අක් මුදල් ලබා නොදීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

**2.3 තත්ත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත පියවිය යුතුව තිබුණද, 2019 පෙබරවාරි සිට 2019 දෙසැම්බර් දක්වා අවස්ථා 30 කදී නිකුත් කර තිබුණු එකතුව රු.360,328 ක තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය අවසන් වූ වහාම නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විවිධ වැඩ සටහන් සඳහා අතුරු අග්‍රිම ලබාදුන් පසුව එම වැඩසටහන නිමවූ වහාම පියවීම් කරන ලෙස සියළුම නිලධාරීන් දැනුවත් කරන ලදි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කොට තිබුණද, එම චක්‍රලේඛයේ ඡේද අංක 3 ප්‍රකාරව ඇතුළත් විය යුතු පහත සඳහන් කරුණු ඒ තුළ අන්තර්ගත වී නොතිබූ බව නිරීක්ෂණය විය.<br><br>(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.<br>(ආ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම.<br><br>(ඇ) සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.<br><br>(ඈ) අභ්‍යන්තර විගණන සැලැස්ම. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. | වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම සම්බන්ධව 2015.09.20 දින ගන්නා ලද කැබිනට් තීරණය අනුව ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශ ලේකම්ගේ අංක MNPEA/ PLN/ APG/ 15 හා 2015/10/14 දිනැති ලිපිය මගින් ලබා දුන් උපදෙස් අනුව නියමිත ආකෘතිය භාවිතා කර 2019 වර්ෂයට ක්‍රියාත්මක සැලැස්මක් සකස්කර ඇති අතර එහි පිටපතක් ලබා දී ඇත.<br><br>2014 පෙබරවාරි 17 දිනැති 2014/01 චක්‍ර ලේකය අනුව ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේ ආකෘතියක් ලබා දී නොමැති අතර ක්‍රියාත්මක සැලැස්මේ ඇතුලත් විය යුතු යැයි එහි සඳහන් කරුණු ඉහත සැලැස්මේ ඇතුලත් කර ඇත.<br><br>කෙසේ වුවද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ප්‍රජා ජල ව්‍යාපෘති වල සියලු ම සංවර්ධන අවශ්‍යතා ඇතුලත් වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් පස් අවුරුදු ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීමට මේ දිනවල කටයුතු කරමින් පවතී. ඉදිරි මාස 02 ඇතුලත එහි පිටපතක් ලබා දීමේ හැකියාව ඇත. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අත් හැරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක 18 කට අයත් ප්‍රජා මූල සංවිධානයන්හි අක්‍රිය ජල ව්‍යාපෘති 324 ක් 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අක්‍රීයව පැවතුණි. කෙසේ වෙතත් ඉන් මාතලේ, මාතර, රත්නපුර හා පුත්තලම යන දිස්ත්‍රික්කවල පවතින අක්‍රීය ජල ව්‍යපෘති නැවත සක්‍රීය කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | අක්‍රිය ජල ව්‍යාපෘති නැවත සක්‍රීය තත්වයට පත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පවතින සීමිත සම්පත් යොදා ගෙන දිස්ත්‍රික් මට්ටමින් පවතින අක්‍රිය ජල ව්‍යාපෘති අවශ්‍යතාවය පරිදි සක්‍රිය තත්වයට පත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතින අතර වර්ෂයක් වැනි කෙටි කාලයක් තුළ ඒ සඳහා ක්ෂණික පියවර ගැනීමේ හැකියාවක් නැත. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2018 හා 2019 වර්ෂවල ආරම්භ කර තිබූ ව්‍යාපෘති 160 ක් අතුරින් 2019 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කළ යුතුව පැවති පිරිවැය රු.59,774,352 ක් වූ ව්‍යාපෘති 32 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබූ බව නිරීක්ෂණය විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන 2019 මැයි මස අයවැය සම්මත වූ පසු අනුමත වී ඇත. ජල ව්‍යාපෘති අවශ්‍යතාවය පරිදි සක්‍රිය තත්ත්වයට පත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතින අතර වර්ෂයක් වැනි කෙටි කාලයක් තුළ ඒ සඳහා ක්ෂණික පියවර ගැනීමේ හැකියාවක් ඇත. |
| (ආ) | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ප්‍රජා ජල ව්‍යාපෘති 17 ක ඉදිකිරීම් කටයුතු 2017 හා 2018 වර්ෂයන් තුළ දී ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත් ඉන් 2018 දෙසැම්බර් 15 දිනට හා 2019 මාර්තු 31 දිනට නිම කළ යුතුව පැවති පිරිවැය රු.142,635,532 ක් වූ ව්‍යාපෘති 05 ක් අතුරින් එක් ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබූ අතර අනෙක් ව්‍යාපෘතීන් නිම කර තිබුණද ඒවා ජනතා අයිතියට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘති නිම කර ජනතා අයිතියට පත්කිරීමට ක්‍රියා කළ යුතු වීම. | නිවාස අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක එක් ව්‍යාපෘතියක ඉතා සුළු වැඩ කොටස් ප්‍රමාණයක් හැර ඉතිරි ව්‍යාපෘති වැඩ නිම කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක කරන ලද හා 2019 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂා කොට තිබූ පිරිවැය රු.1,782,992,419 ව්‍යාපෘති 123 කින් පිරිවැය රු.16,187,182 ක් වූ ව්‍යාපෘති 03 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබුණි. දිස්ත්‍රික්ක 16 ක් තුළ ක්‍රියාත්මක කරනු ලැබූ මුළු පිරිවැය රු.785,058,909 ක් වූ ව්‍යාපෘති 46 ක ප්‍රගතිය සියයට 75 කට වඩා අඩු බව නිරීක්ෂණය විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන වර්ෂය තුළදී අවසන් වන බැවින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති අවසන් කිරීමට සැලසුම් කරන ලදී.<br>එසේ වුවද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී, කාලගුණික බලපෑම් අක් මුදල් නොලැබීම ආදිය හේතු කොට ගෙන ව්‍යාපෘති අවසන් කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත.එම සියලු ව්‍යාපෘති මෙම වර්ෂයේ ඉදිරි මාස 2 ඇතුළත අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2015 සිට 2019 දක්වා වූ වර්ෂයන්ට අදාළ දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තා 2020 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2015, 2016, 2017, 2018 වර්ෂ සඳහා කාර්යසාධන වාර්තාව පිලියෙල කර ඇත. ඉදිරි මාස 03 ඇතුලත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනයන්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා (ආ) ඡේදයේ සඳහන් පරිදි දෙපාර්තමේන්තුව විසින් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතු වීම. | වාර්ෂිකව ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය මත පදනම්ව 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.ඉදිරියේදී වර්ෂ 03ට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනවලින් දෙපාර්තමේන්තුවේ කුරුණෑගල, අනුරාධපුර වව්නියාව යන දිස්ත්‍රික් කාර්යාලය සඳහා ද, දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය සඳහා ද කුලී පදනම මත ධාවනයේ යොදවා ගැනීම සඳහා කැබ් රථ 04 ක් ප්‍රසම්පාදනය කරගෙන තිබුණි. කෙසේ වෙතත් එම වාහන සැපයීම සඳහා තෝරාගත් ලංසුකරුවන් විසින් එකඟ වූ වාහන 04 වෙනුවට වෙනත් වාහන 04 ක් ප්‍රසම්පාදන කමිටුවේ හෝ තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රථම ධාවනයේ යොදවා තිබූ අතර ඒ වෙනුවෙන් ගිවිසුම්වලට ද එළඹ තිබුණි. තවද, එලෙස රාජකාරියේ යොදවා තිබූ වාහන 03 ක් වෙනුවෙන් අගෝස්තු හා සැප්තැම්බර් මාසවලට අදාළ වාහන කුලිය ලෙස රු.1,200,603 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත 2020 පෙබරවාරි 28 වන දින ගෙවා තිබුණි. තවද එම වාහන අතුරින් කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය සඳහා ප්‍රසම්පාදනය කර තිබූ වාහනයේ අයිතියද ගිවිසුම්වලට එළඹෙන විට සැපයුම්කරු සතු නොවූ බවද නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් අනුගමනය කළ යුතු වීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ගත් වාහනය වෙනුවට ඒ හා සමාන පිරිවිතරයන්ට ගැලපෙන වෙනත් වාහනයක් සැපයීමට හැකි බව සටහන් කර ඇත. ඒ අනුව තෝරා ගත් වාහන වල පිරිවිතර වලට අනුකූල වෙනත් වාහන 04ක් සේවය සඳහා යොදා ගන්නා ලද අතර ඒ සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට පෙර තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ සියලු දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පී.වී.සී බට හා උපාංග, පොම්ප, ජී.අයි බට යනාදී ප්‍රධාන අයිතම්වල අවශ්‍යතාවයන් එකවර හදුනාගෙන එම මුළු අවශ්‍යතාවය වෙනුවෙන් එක් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට කටයුතු කිරීමකින් තොරව වරින් වර පුවත්පත් දැන්වීම් පළ කරමින් එම ද්‍රව්‍ය වරින් වර ප්‍රසම්පාදනය කර ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.4 ඡේදය ප්‍රකාරව විධිමත් හේතු ඉදිරිපත් කොට ප්‍රසම්පාදන කමිටුවේ හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද එසේ ප්‍රදානය කරන ලද එකම අයිතමය මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රදානය කරන ලද වෙන වෙනම වූ කොන්ත්‍රාත්තුන් ප්‍රසම්පාදන කමිටු කිහිපයක් යටතේ ඇගයීමට ලක්කොට කමිටු සාමාජිකයන් වෙනුවෙන් දීමනාද වෙන වෙනම ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ සමස්ථ පීවීසී බට හා උපාංග අවශ්‍යතාවය කලින් සැලසුම් කර ඒ අනුව වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම. | PVC හා උපාංග මිලදී ගැනීමට වැය වන ඇස්තමේන්තු මුදල මිලියන 530 ක් වන අතර එසේ එක් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවීමට කටයුතු කළේ නම් එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සීමාව මෙන්ම අමාත්‍යාංශ ප්‍රසම්පාදන සීමාවද ඉක්මවා යන බැවින් අමාත්‍ය මණ්ඩලය විසින් නම් කරන ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදු කළ යුතු වේ.එම කාර්ය සඳහා මීට වඩා කාල සිමාවක් ගත වීමට සිදු විය හැක.<br><br>ඉහත පැහැදිලි කර ඇති පරිදි වෙන වෙනම කොන්ත්‍රාත් ප්‍රදානය වඩාත්ම ඵලදායී, කාර්යක්ෂම හා ලාභදායී ක්‍රියාවලිය වේ.ප්‍රසම්පාදන අත්පොතෙහි Supplement 32 අනුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා |

| | | |
|---|---|---|
| | | ගෙවීම් සිදු කරනු ලබනුයේ එක් එක් කොන්ත්‍රාත්තුවෙහි වටිනාකම අනුවය.ඒ අනුව එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන වෙනම ගෙවීම් සිදු කළ හැක.එම නිසා ප්‍රසම්පාදන අත් පොතෙහි 2.9.1 ඡේදය අනුව ගෙවීම් කිරීම මගින් වැඩිපුර මුදලක් ගෙවීම සිදු කර නොමැත.මෙම දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ මාර්ග ඉදි කිරීමේ කර්මාන්ත 22 සඳහා මෙලෙසම ගෙවීම් සිදු කර ඇත. |

## 3.6 වත්කම් කළමනාකරණය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ධාවනයට යොදා නොගන්නා වාහන | | |
| දෙපාර්තමේන්තුව සතු වාහන තුන (03) ක් ධාවනය නොකර දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ ගාල් කර තිබුණු බව 2020 ජනවාරි 03 හා 28 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය. | ගරහිත තත්වයේ වාහන අලුත්වැඩියා කළ නොහැකි නම් වෙන්දේසි කිරීමට පියවර ගත යුතු වීම. | අංක 57 – 0015 දරණ කැබ් රථය සම්බන්ධයෙන් මෝටර් වාහන කාර්මික නිලධාරීගේ අදහස වූයේ එය අළුත්වැඩියා කිරීම අවාසි සහගත බව වන අතර 2019 වර්ෂයේ රක්ෂණ සහතික ලබා ගැනීම පිණිස මෝටර් වාහන තක්සේරු කිරීමට පත් කල මණ්ඩලයේ සාමාජිකයෙකු වූ මෝටර් රථ දෙපාර්තමේන්තුවේ පරීක්ෂක විසින් තීරණය කරනු ලැබුවේ එය වෙන්දේසි කිරීම සුදුසු බවයි.<br><br>WP – GB – 0066 කැබ් රථය අළුත්වැඩියාව සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු නිම කර ගැනීමට නොහැකි වී තිබේ.<br><br>WP – GD 2233 කැබ් රථය මෝටර් රථ කාර්මික නිලධාරී පරීක්ෂා කර බැලීමේ දී දැනට සිදු කළ යුතු අළුත්වැඩියාවන් වෙනුවෙන් රුපියල් ලක්ෂ හතරක මුදලක් වැයවේ යැයි සඳහන් කිරීම මත ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම හේතුව මත අළුත්වැඩියා කිරීම තරමක් ප්‍රමාද වී තිබේ. |

(ආ) වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීම

-----------------------------------------

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත් ප්‍රජා ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ වාහන දහයක් (10) ඇතුළුව වෙනත් ආයතන වලට අයත් වාහන දාහතක් (17) ක් සමාලෝචිත වර්ෂය තුළ පරිහරණය කර තිබුණි. | මෙම වාහන විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතනවලට මුදා හැරීමට කළ යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දැනටමත් වාහන 13 ක් පවරා ගැනීමට වාහනවල ලියාපදිංචි අය අනුමැතිය ලබා දී තිබේ. එම වාහනවල වර්තමාන ලියාපදිංචි ආයතනවලින් අනුමැතිය ලැබී ඇති අතර, එම අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා පැවරීමට ප්‍රමාද වූ නමුත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත එම පැවරීම් යොමු කිරීමට කටයුතු කරමින් පවතී. වාර්තාවේ සඳහන් ඉතිරි වාහන 04 පවරා ගැනීමේ ඉදිරි කටයුතු ද සිදු කරමින් පවතින අතර ඉදිරියේ දී ඒවා ද දෙපාර්තමේන්තුවේ අයිතිය තහවුරු කර ගැනීමේ හැකියාව පවතී. |

(ඇ) දෙපාර්තමේන්තු වත්කම් ඌන උපයෝජනය

-----------------------------------

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ 2019 වර්ෂය තුළදී ධාවනය සඳහා යොදවා තිබූ සංචිත වාහන අතුරින් වාහන 03 ක් සමාලෝචිත වර්ෂයේ මාස 08 ක් තුළදී කිලෝමීටර 500 කට අඩු දුර ප්‍රමාණයක් ධාවනය කර තිබිය දී කුලී පදනම මත ලබා ගත් වාහන දෙකක් ද ප්‍රධාන කාර්යාලීය රාජකාරි සඳහා යොදාගෙන තිබුණි. කෙසේ වෙතත් එම කුලී වාහන ද ගිවිසුම් ගත දුර ප්‍රමාණයන්ට වඩා අඩු දුර ප්‍රමාණයන් සමාලෝචිත වර්ෂය තුළ දී ධාවනය කර තිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහන පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | වාරිමාර්ග හා මහවැලි අමාත්‍යාංශය යටතේ පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර, වවුනියාව, ත්‍රිකුණාමලය හා මන්නාරම යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ වන සංවර්ධන ව්‍යාපෘති රැසක පාර්ශවකරුවෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුව සම්බන්ධ වී ඇත. එම ව්‍යාපෘතියන්හි රාජකාරී ඉටු කරන නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා එකී වාහන කුලී පදනම මත ලබා ගැනීමට එම ව්‍යාපෘතිය යටතේ මුදල් වෙන් කර දී ඇති අතර, ව්‍යාපෘතිය ආරම්භක කාලය බැවින් ධාවනය වූ දුර ප්‍රමාණය යම් කිසි අඩුවක් පැවතිය ද මේ වන විට එම තත්ත්වය වෙනස් වී ඇත. දැනට එම වාහනය පමණක් එම ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතුවල යෙදීමට ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති අතර, එහි ගිවිසුම්ගත ප්‍රමාණය ධාවනය කෙරේ. |

## 3.7 රජයේ නිලධාරීන්ට ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (1) (ග) ප්‍රකාරව ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තැබිය යුතු වුවද එසේ ඇප තබා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 07/2019 හා 2019.03.23 දිනැති චක්‍රලේඛය අනුව ඉදිරි කටයුතු කරමි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ තිරසාර සංවර්ධන අරමුණු ලෙස සැමට ජලය තිරසාර කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ මඟපෙන්වීම් හා වැඩමුළු කිසිවක් ආයතනය විසින් පවත්වා නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු සිදු කළ යුතු වීම. | තිරසර සංවර්ධන අරමුණුවල සැමට සුරක්ෂිත ජලය හා සනීපාරක්ෂාව ලබා දීම යටතේ අදාල ඉලක්ක පිහිටුවීම ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පාර්ශව වල දායකත්වය ලබා දීම ජල සම්පාදන අමාත්‍යාංශය විසින් සිදු කර ඇත. එබැවින් අමාත්‍යාංශය සංවිධානය කල රැස්වීම වැඩමුළු සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී කර ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුවේ කාර්යය භාර්යය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 117.51 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.529,326 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 30 සිට සියයට 100 ක පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 52 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තු ගත තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇතත්, මෙතෙක් එම තනතුරු සඳහා බඳවා ගැනීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී නැත.<br><br>කෙසේ වෙතත් 2019 වර්ෂය තුල පවතින පුරප්පාඩු අතරින් 06 ක් සම්පූර්ණ කිරීමට හැකියාව ලැබුණු අතර, අභ්‍යාසලාභී උපාධිධාරීන් 124 ක් පුහුණුව සඳහා අනුයුක්ත කර ගනිමින් එම පුරප්පාඩු මගහරවා ගැනීමට කටයුතු කර ඇත. |